කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
MINISTRY OF AGRICULTURE

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

# ප්‍රසම්පාදන දැන්වීම

## කුඩා පරිමාණ ගොවියන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීම

1. කොවිඩ් 19 වසංගත තත්වය තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය සඳහා සහය ලබාදීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හදිසි ආපතිකතා ප්‍රතිචාර සංරචකය (CERC) යටතේ ණය ආධාර ලැබී ඇත. දිවයින පුරා කුඩා පරිමාණ ගොවීන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ මෙම ණය මුදල සුදුසුකම් ලත් ගෙවීමක් ලෙස ඉදිරියට ගෙන යාමට කෘෂිකර්ම අමාත්‍යාංශය අදහස් කරයි.
2. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් දිවයින පුරා **"කුඩා පරිමාණ ගොවියන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීම"** සඳහා යෝග්‍යතාපූර්ණ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.
   - ඉදිකිරීම් පිළිබඳ වැඩිදුර තොරතුරු පහත පරිදි කෘෂිකර්ම අමාත්‍යාංශයේ වෙබ් අඩවියට උඩුගත කර ඇත.

**www.agrimin.gov.lk**
ප්‍රධාන මෙනුවෙන් බාගැනීම් වෙත ගොස් ආකෘති පත්‍ර තෝරන්න

3. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ඉහත සඳහන් ලෙස ලබාගත් **2021 අගෝස්තු 3 දක්වා** වන වලංගු දිනයක් සහිත ලංසු ආරක්ෂණයක් සමග ඉහත කටයුතු සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට ලංසුකරුවන්ට අවස්ථාව ලබා දෙනු ලැබේ. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර ඉහත වගුවේ දක්වා ඇති ඉදිකිරීම් (කටයුතු)වලට අදාළ ශ්‍රේණි සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී සිටිය යුතුය
4. ලංසු කැඳවීම, ලෝක බැංකුව මගින් අනුමත ජාතික තරගකාරිත්ව ලංසු (NCB) පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.
5. උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට ඉහත වෙබ් අඩවියේ දක්වා ඇති වගකීම දරන නිලධරයන්ගෙන් වැඩි දුර විස්තර ලබාගත හැකි අතර **2021 අප්‍රේල් 20** සිට **2021 මැයි 10** දක්වා **පැය 0900** සිට **පැය 1500** අතර කාලය තුළ එම ස්ථානයේදීම ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.
6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ඉහත වෙබ් අඩවියේ සඳහන් නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවා එහි සඳහන් වගකිවයුතු නිලධාරීන් වෙත **2021 අප්‍රේල් 20** සිට **2021 මැයි 10** දක්වා පැය **0900** සහ **පැය 1500** අතර කාලය තුළ ලිඛිත අයදුම්පත්‍රයක් යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

   ගෙවීමේ ක්‍රමය වන්නේ මුදල් මගින් ගෙවීමයි.
7. ලංසු දත්ත පත්‍රිකාව/සැලැස්ම තුළ දක්වා ඇති ලිපිනයට **2021 මැයි 11 පැය 1430ට** පෙර ලංසු එවිය යුතුය. විද්‍යුත් මාර්ගයෙන් ලංසු ඉදිරිපත් කිරීමට අවසර නොලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. **2021 මැයි 11 වෙනිදා පැය 1430 ට** පැමිණීමට අදහස් කරන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
8. ලංසු **2021 ජූලි 06 දක්වා** වලංගු විය යුතු ය.
9. සම්පූර්ණ කරන ලද ලංසු මුල් පිටපත සහ අනු පිටපත ලෙස පිටපත් දෙකකින් එවිය යුතුය. මුල් පිටපත සහ දෙවන පිටපත වෙන වෙනම "මුල් පිටපත" සහ "අනුපිටපත" ලෙස සලකුණු කර මුද්‍රා තබන ලද ලියුම් කවර දෙකක බහාලිය යුතුය. එම මුද්‍රා තබන ලද ලියුම් කවර දෙක, ඉහළ වම් කෙළවරේ **"කුඩා පරිමාණ ගොවීන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීම"** යනුවෙන් සහ කොන්ත්‍රාත් අංකය සටහන් කළ එක් ලියුම් කවරයක බහා මුද්‍රා තැබිය යුතුය.
10. ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ ලංසු ලේඛනයේ දක්වා ඇති ස්ථානයට අතින් ගෙනවිත් භාරදිය හැකිය. ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශ වෙත ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරෙන බැවින් ලේඛන නිවැරදි ස්ථානයටම භාර දෙන ලෙස ඔබට තරයේ උපදෙස් දෙනු ලැබේ.

11 **2021 අප්‍රේල් 30 වන දින පැය 1030ට**, ලංසු ලේඛනයේ ලංසු දත්ත පත්‍රිකාවේ/ සැලසුමේ සඳහන් වගකිව යුතු කාර්යාලයේදී පූර්ව ලංසු රැස්වීම පැවැත්වෙනු ඇත.

**ලේකම්**
**කෘෂිකර්ම අමාත්‍යාංශය**
**80/5, "ගොවිජන මන්දිරය",**
**රජමල්වත්ත පාර, බත්තරමුල්ල**